# සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය පිළිබඳ තොරතුරු බිඳක්...

මෙම ආයතනය ප්‍රධාන වශයෙන් ජාතික බීජ නිෂ්පාදන වැඩසටහන යටතේ ගුණාත්මක බීජ අර්තාපල් නිෂ්පාදනයෙහි නියැලී සිටින අතර උඩරට එළවළු, පළතුරු සහ මල් බෝග පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා මූලික සහාය ලබාදෙයි. මෙහි අරමුණු ප්‍රධාන වශයෙන් යොමු වී ඇත්තේ අස්වැන්න පදනම් කරගෙන අර්තාපල්වල ප්‍රභේදය වැඩිදියුණු කිරීම, පළිබෝධ හා රෝග පාලනය, උසස් තත්ත්වයේ එළවළු ප්‍රභේද හා සියළුම බෝගවල පළිබෝධ හා රෝග පාලන විධි ක්‍රම තෝරා ගැනීම කෙරෙහි ය.

## අභිප්‍රාය

අර්තාපල්, උඩරට එළවළු හා සර්ව කලාපීය පළතුරු බෝගවල ඵලදායීතාව සහ ලාභදායී බව ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක දැනුම දියුණු කිරීම හා යොදා ගැනීම මෙහි අභිප්‍රාය ලෙස සඳහන් කළ හැකි ය.

## ඉතිහාසය

1960 වර්ෂයේ දී, එක් පර්යේෂණ නිලධාරියෙකු යටතේ ආරම්භ කොට ඇති මෙම පර්යේෂණ ආයතනය, එම අවධියේ දී පර්යේෂණාගාරය හා කාර්යාලය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන ගොස් ඇත. මෙම පර්යේෂණ ආයතනය උඩරට ප්‍රදේශයේ පිහිටා තිබූ විශාලම පර්යේෂණ ආයතනය වූ අතර මෙය රහංගල පර්යේෂණ ස්ථානය මගින් පාලනය විය. රහංගල පර්යේෂණ ස්ථානයෙන් නිලධාරීන් පැමිණ අත්හදාබැලීම් කටයුතු සිදු කොට තිබේ. සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ආයතනය ආරම්භ කොට නොබෝ දිනකින් අර්තාපල් පිළිබඳ විශේෂඥයෙකු වූ බටහිර ජර්මානු ජාතික ආචාර්ය සීසර් මහතා අර්තාපල් සම්බන්ධ කටයුතු කිරීමට පත් කොට ඇත.

එසේ වුව ද, එකල පරිභෝජනයට අවශ්‍ය අර්තාපල් මෙරටට නිදහසේ ආනයනය කළ බැවින් දේශීය අර්තාපල් වගාව පර්යේෂණ ස්ථානයන්ට හා රජයේ ගොවිපළ වලට පමණක් සීමා විය. එම කාලයේදීම, පොහොර අත්හදා බැලීම් හා අර්තාපල් වගා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීමට පර්යේෂණ සිදු කොට ඇත.

1966 අර්තාපල් ආනයනය තහනම් කළ බැවින් අර්තාපල් වල මිල ඉහළ යාමත් සමග දේශීය අර්තාපල් කෙරෙහි අවධානය යොමු විය. මේ වන විට ද පර්යේෂණ ස්ථානවලට සුදුසු ප්‍රදේශ හඳුනාගෙන පැවති අතර අනෙකුත් සම්ප්‍රදායික භාවිත පිළිබඳව ද, අදාළ නිර්දේශ සම්පාදනය කොට ගෙන තිබුණි.

දිස්ත්‍රික්කය තුළ අර්තාපල් වගාවේ ව්‍යාප්තියත් සමග පර්යේෂණ ස්ථානයේ අවශ්‍යතාවය ද වැඩි විය. මෙහි දී, ප්‍රභේද, දිලීරනාශක, කෘමිනාශක, පොහොර යෙදීම හා අනෙකුත් සංස්කෘතික චර්යාවන් සම්බන්ධයෙන් නව නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී. එසේම, උද්‍යාන බෝග සඳහා ද, ඒ ආකාරයටම එම පර්යේෂණ කටයුතු සිදු කරන ලදී. මෙහි උද්‍යාන බෝග අංශයට ජර්මන් රජයෙන් බොහෝ තාක්ෂණික මෙන් ම මූල්‍ය ආධාර ලැබුණි.

උද්‍යාන බෝග විද්‍යා පිළිබඳ විශේෂඥයෙකු වූ බටහිර ජර්මන් ජාතික පී.ආර්. කාලස් මහතා වර්ෂ 1971 සිට 1976 දක්වා මෙහි සේවය කරන ලදී, මෙම ස්ථානය මගින් ශෂ්‍ය විද්‍යාව, අභිජනනය හා කායික විද්‍යාව පිළිබඳ අත්හදා බැලීම් විශාල සංඛ්‍යාවක් සිදු කිරීමට අමතරව පහත ස්ථාන 5 ද එනම්, ගන්නොරුව, මහඉලුප්පල්ලම, බණ්ඩාරවෙල, යාපනය, අඟුණකොලපැලැස්ස යන ස්ථානවල එළවළු පිළිබඳ අත්හදා බැලීම් සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස විවිධ ප්‍රදේශවල වගාකල හැකි එළවළු ප්‍රභේද වල ප්‍රගතිය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ප්‍රසිද්ධියට පත් කරන ලදී.

බටහිර ජර්මන් ආධාර ඇතිව 1970 වසරේ දී වර්තමාන පර්යේෂණ ගොඩනැගිලි ඉදි කොට ඇත.

ඊට අමතරව, ජර්මන් රජය විසින් වටිනා පර්යේෂණාගාරයක්, ක්ෂේත්‍ර උපකරණ, වාහක හා වර්ධන කුටි ප්‍රදානය කොට ඇත. ගොඩනැගිලි විශාල කිරීමත් සමග පර්යේෂණ මෙන් ම කාර්ය මණ්ඩලය ද වැඩි කරන ලදී.. පසුව, උද්‍යාන බෝග විද්‍යා, ව්‍යාධිවේදී, කීට විද්‍යා, පාංශු රසායන වැනි විවිධ අංශ ද එක්කොට ඇත. පාලිත තත්ත්ව යටතේ පර්යේෂණ සිදු කිරීමට හැකිවන ආකාරයට ආරක්ෂිත වීදුරු ගෘහ ද, කාර්ය මණ්ඩලයට නවාතැන් ගැනීමට නිල නිවාස ද ඉදි කොට තිබේ.

වර්ෂ 1974 සිට 1977 දක්වා මෙම ස්ථානයේ පැවති උද්භිද ව්‍යාධි විද්‍යා ව්‍යාපෘතිය සඳහා ජපාන රජයේ ආධාර ඇතිව උද්භිද ව්‍යාධි විද්‍යා විද්‍යාගාරය ස්ථාපිත කරන ලදී. මෙම ව්‍යාපෘතිය 1977 අගෝස්තු මාසයේ ආරම්භ කෙරිණි. පසුව, මෙහි පර්යේෂණ කටයුතු මෙරට පර්යේෂකයින් විසින් සිදු කරන ලද අතර මූල්‍ය ප්‍රතිපාදන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන ලදී. අනතුරුව කාලයත් සමග විදේශ ආධාර හා තාක්ෂණික දැනුම ලබාදීම අඩු වුවත්, එය මෙම ආයතනයේ ක්‍රියාකාරීත්වය සඳහා බලපෑමක් ඇති නො කළේ ය.

වර්තමානයේ ශ්‍රී ලංකාවට බීජ අර්තාපල් ටොන් 4,300 ක් වාර්ෂිකව ආනයනය කරයි. ආනයනය කරනු ලබන සියලුම ප්‍රභේද මෙරටට ගෙන්වීම සඳහා නිර්දේශ කරනු ලබන්නේ මෙම පර්යේෂණ ආයතනයේ මහා අධීක්ෂණය යටතේ ය. මෙහි දී, එම ප්‍රභේදයන් හි අස්වැන්න, රෝග පළිබෝධ වලට ඇති ප්‍රතිරෝධීතාවය වැනි කරුණු පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කරයි. ඒ අනුව, මෙම පර්යේෂණ ආයතනය අර්තාපල් පිළිබඳ පර්යේෂණ කටයුතු සඳහා සුවිශේෂී ස්ථානයකි. අර්තාපල් පිළිබඳ විවිධාකාරයේ පර්යේෂණ පවත්වා ශ්‍රී ලංකාවේ වගා කිරීමට සුදුසු ප්‍රභේද හඳුන්වා දෙනු ලබයි.

දිලීර නාශක, කෘමි නාශක හා පොහොර වර්ග පිළිබඳ තොරතුරු ද ව්‍යාප්ති අංශය හරහා ගොවීන් වෙත ලබා දෙයි. එමෙන් ම, ව්‍යාප්ති නිලධාරීන්ට හා ගොවීන්ට ඇති වන හඳුනාගත නො හැකි ගැටළු පිළිබඳ උපදෙස් ලබාදීම ද සිදු කරයි. මෙහි දී රෝගී ශාක නිදර්ශක ලබා ගෙන විද්‍යාගාර තත්ත්ව යටතේ පර්යේෂණයන් සිදු කර විසඳුම් ලබා දෙයි.

මෙම පර්යේෂණ ආයතනය අර්තාපල් වලට අමතරව උඩරට එළවළු බෝග පිළිබඳව ද පර්යේෂණ සිදු කරනු ලබයි. අර්තාපල් මෙන් ම ආනයනය කරනු ලබන උඩරට එළවළු බීජ ද මෙරටට ගෙන්වීම සඳහා නිර්දේශ කරනු ලබන්නේ මෙම පර්යේෂණ ආයතනයේ අධීක්ෂණය යටතේ ය. එමෙන් ම, මෙම පර්යේෂණ ආයතනය උසස් තත්ත්වයේ අභිජනන බීජ නිෂ්පාදනය කොට ඒවා එළවළු ගොවීන් හට ලබා දෙයි. මෙම පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කළ අභිජනන බීජ අතර ග්‍රීන්පීස් (ප්‍රභේදය – ෆෙල් බාස්කට් (Fell basket) රාබු (ප්‍රභේදය ජපන් බෝල Japanese ball) සහ ගෝවා (ප්‍රභේදය – ලංකා ගෝවා). යනාදිය වේ.

ස්ට්‍රෝබෙරි වගාව පිළිබඳ විවිධ පර්යේෂණ කටයුතු සිදු කර ඒවා නුවරඑළිය දිස්ත්‍රික්කය පුරා ව්‍යාප්ත කිරීම හා වගා කරන ගොවීන් දැනුවත් කිරීම මෙම ආයතනය මගින් සිදු කරයි. දැනට 'වැන්ඩිලර' නමින් ප්‍රභේදයක් නිදහස් කර ඇති අතර කෙන්ඩෝල්, කේම්බ්‍රිජ්, ෂස්ටා, ෆිනෝමිනල් යන වර්ග පිළිබඳව පර්යේෂණ සිදු කරමින් පවතී.

වර්තමානයේ මෙම ආයතනය විවිධ වූ අංශ නවයකින් සමන්විත වේ. ඒවා නම් පටක රෝපණ අංශය, අභිජනන අංශය, ශෂ්‍ය විද්‍යා I අංශය, ශෂ්‍ය විද්‍යා II අංශය, උද්භිද ව්‍යාධි විද්‍යා අංශය, පාංශු රසායන අංශය, කීට/වටපණු අංශය, උද්‍යාන විද්‍යා අංශය හා ගොවිපළ අංශයයි.

## වැදගත් සිද්ධීන්

පසුගිය කාලයේ මෙම ආයතනය තුළ සිදු කළ වැදගත් පර්යේෂණයන් අතරින් ප්‍රධාන වන්නේ අර්තාපල් බීජ නිෂ්පාදන වැඩසටහනයි. දේශීය බීජ අර්තාපල් නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවසරය යටතේ 1998 වර්ෂයේ විශේෂ බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ අංග සම්පූර්ණ පටක රෝපණ රසායනාගාරයක් පර්යේෂණ ආයතනය තුළ ස්ථාපිත කරන ලදී. මෙම පටක රෝපණ රසායනාගාරයෙන් ලෙඩ රෝග වලින් තොර පටක රෝපිත අර්තාපල් පැළ (in vitro) නිෂ්පාදනය කරන ලදී. පටක රෝපණ රසායනාගාරයට අමතරව අංග සම්පූර්ණ උද්භිද

ව්‍යාධි විද්‍යා රසායනාගාරයක්, පාංශු රසායන රසායනාගාරයක් හා කීට/වටපණු රසායනාගාරයක් ස්ථාපිත කරන ලදී. ආරක්ෂිත ගෘහ තුළ පස් මාධ්‍යයේ පෙර මූලික බීජ අර්තාපල් සිටුවා අර්තාපල් රිකිලි පැළ නිෂ්පාදනය කර පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලදී. මෙහි දී, අඩු අස්වැන්න (එක් ගසකින් අල 2-3) පාංශු රෝග වැනි විවිධ ගැටළු වලට මුහුණ දීමට සිදුවිය. මෙයට විසඳුමක් ලෙස පස් මාධ්‍ය ඉවත් කර දහයියා අඟුරු, තේ අපද්‍රව්‍ය හා කොහුබත් මිශ්‍ර කර නව මාධ්‍යයක් සකසා මෙම බීජවල අස්වැන්න, සහ තත්ත්වය නැංවීමට පර්යේෂණ සිදු කරන ලදී.

මෙහි ප්‍රතිඵලයක් ලෙස අස්වැන්න එක් ගසකින් අල 10-13 ක් ලෙස ඉහළ නැංවීමට සමත් විය. මෙසේ ලබා ගත් බීජ 'ක්ෂුද්‍ර බීජ' ලෙස නම් කළ අතර මේවා පෝච්චි වල සිටුවා නැවත පර්යේෂණ සිදු කරන ලදී. මෙම පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස ලබාගත් බීජ ගොවීන්ට හඳුන්වා දුන් අතර වර්තමානයේ ඔවුන් එම බීජ වගා කිරීම සඳහා වැඩි නැඹුරුවක් දක්වන බව පෙනේ.

මෙයට අමතරව, පෙර මූලික බීජ අර්තාපල් වැඩසටහනට පෙර පසු අංගමාරයට ප්‍රතිරෝධී "සීතා" හා "කෘෂි" ප්‍රභේද 1982 වර්ෂයේ දී, නිදහස් කරන ලදී. 1992 දී සත්‍ය බීජ ප්‍රභේද දෙකක් වන පසු අංගමාරයට ප්‍රතිරෝධී "ලක්ෂ්මී" හා "මැණිකා" ප්‍රභේද නිදහස් කරන ලදී. එසේ ම, ඉහළ අස්වැන්නකින් හා පසු අංගමාරයට ප්‍රතිරෝධී "හිල් ස්ටාර්" හා "ගෝල්ඩන් ස්ටාර්" නමින් ප්‍රභේද දෙකක් පිළිවෙලින් 1999 හා 2010 වර්ෂ වල දී නිදහස් කරන ලදී.

## අභිජනන අංශය

සත්‍ය අභිජනන බීජ නිෂ්පාදනය 70 දශකයේ CIP ආධාර යටතේ ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රභේද දෙකක් නිදහස් කරන ලදී. ඉහළ අස්වැන්නක් හා පසු අංගමාරයට ප්‍රතිරෝධී ආහාරය සඳහා සුදුසු අර්තාපල් පෙළ 3ක් හා නිෂ්පාදන සඳහා යොදා ගත හැකි අර්තාපල් පෙළ 3ක් නිදහස් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

## උද්භිද ව්‍යාධි විද්‍යා හා කීට/වටපණු අංශය

### උද්භිද ව්‍යාධි විද්‍යා අංශය

යුරෝපයෙන් හඳුන්වා දෙන ලද අර්තාපල් ප්‍රභේද ගොවීන් හට ව්‍යාප්ත කිරීම පසුගිය වසර 50 තුළ සිදු කරන ලදී. මෙහි දී, පසු අංගමාරය හා බැක්ටීරියානු හිටු මැරීම මෙම ප්‍රභේද වල පැවති ප්‍රධාන ගැටළුව විය. මේ සඳහා පර්යේෂණ සිදු කොට ඒවා පාලනය සඳහා නිර්දේශයන් ලබා දීමත්, මෙම පර්යේෂණ ආයතනයෙන් සිදු කරන ලදී.

CIP ව්‍යාපෘතිය යටතේ ලබා දුන් ප්‍රභේද සඳහා බැක්ටීරියානු හිටු මැරීමත්, පසු අංගමාරයත් පිළිබඳව පර්යේෂණ නිලධාරීන් කණ්ඩායමක් එකතු වී විවිධ ස්ථානවල පර්යේෂණ සිදු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම රෝග පාලනයට ක්‍රම සොයා ගත් අතර වර්තමානයේ ද පර්යේෂණ සිදු කෙරෙමින් පවතී.

### කීට/වටපණු අංශය

අර්තාපල් වගාවේ කියත් පණු හානිය පාලනය සඳහා පර්යේෂණ සිදු කොට පළමුව කෘමි නාශක හඳුන්වා දුන් අතර ජෛව විද්‍යාත්මක පාලන ක්‍රම පිළිබඳ පර්යේෂණ සිදු කරමින් පවතී. අර්තාපල් ආකන්ධ සලබයා හා කුඩිත්තන් සඳහා පර්යේෂණ සිදුකොට ඔවුන් පාලනය සඳහා ක්‍රම හඳුන්වා දෙන ලදී. රන්වන් කෝෂ්ඨ වටපණු හා පත්‍ර කනින්නා සඳහා ද පර්යේෂණ සිදුකොට ජෛව විද්‍යාත්මක පාලන ක්‍රම හඳුන්වා දෙන ලදී. එමෙන් ම, උඩරට එළවළු වගාව හා ස්ට්‍රෝබෙරි වගාවේ පළිබෝධකයින් සඳහා විවිධ පර්යේෂණ සිදු කළ අතර වර්තමානයේ ද සිදු කරමින් පවතී.

## ශෂ්‍ය විද්‍යා අංශය

බෝග වගාවන් හි පරතරය, පොහොර භාවිතය සහ වෙනත් වගා ක්‍රම එනම්, සිටුවන කාලය, වල් පැලෑටි පාලනය වැනි කරුණු පිළිබඳ පර්යේෂණ සිදු කළ අතර වර්තමානයේ ද සිදු කෙරෙමින් පවතී. අර්තාපල් වගාව සඳහා යාපනය, කල්පිටිය

යන ප්‍රදේශ සුදුසු දැයි පරීක්ෂා කිරීම සඳහා පර්යේෂණ කටයුතු වර්තමානයේ ආරම්භ කොට ඇත.

අර්තාපල් පොහොර නිර්දේශවල සුළු වෙනස්කම් සිදු කොට ඉහළ අස්වැන්නක් ලබා ගැනීම සඳහා පර්යේෂණ කටයුතු සිදු කරන ලදී. මෙහි දී, පෙර මූලික බීජ අස්වැන්න ඉහළ නැංවීම සඳහා නිර්දේශිත නයිට්‍රජන් පොහොර ප්‍රමාණයෙන් 50%ක් මූලික අවස්ථාවේ දී ද, ඉතිරිය බීජ සිටුවා සති 2 පසුව ද, යෙදීම සුදුසු බව පර්යේෂණ වලින් සොයා ගෙන තිබේ.

## බිම්මල් වගාව

බිම්මල් සඳහා පර්යේෂණ කටයුතු 2003 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. බොත්තම් බිම්මල් ප්‍රභේදයක් වන "ගජමුතු" බිම්මල් 2005 වර්ෂයේ දී ගන්නොරුව, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය හා එක්ව නිදහස් කරන ලදී. එමෙන් ම, "ෂිටාකේ" බිම්මල් වගා කිරීම සඳහා සුදුසු තත්ත්වයන් තිබේ දැයි පරීක්ෂා කරමින් පවතී.

## සේවාවන්

පර්යේෂණ කටයුතු වලට අමතරව, මෙම පර්යේෂණ ආයතනය මඟින් සිදු කරන තවත් සේවාවන් රැසකි. ඒවා අතර

- රජයේ ගොවිපළවල බීජ අර්තාපල් වගා කිරීමට පෙර ඒවායේ රන්වන් කෝෂ්ඨ, වටපණු හා බැක්ටීරියානු හිටු මැරීම සඳහා පරීක්ෂාවන් සිදු කොට දී ගුණාත්මයෙන් ඉහළ බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා දායකවීම.
- ගොවීන්ගේ පස් පරීක්ෂා කොට එහි පී.එච්. අගය හා පොහොර නිර්දේශය ලබාදීම.
- අර්තාපල්, උඩරට එළවළු හා පළතුරු වර්ග වල රෝග විනිශ්චය කිරීම.

## විශේෂ ක්‍රියාකාරකම්

ජාත්‍යන්තර අර්තාපල් සම්මන්ත්‍රණය සංවිධානය කොට පැවැත්වීම, මෙය 2008 වර්ෂයේ අප්‍රේල් මස 3-4 යන දිනවල දී පවත්වන ලද අතර අර්තාපල් පර්යේෂණ අඩංගු කෘතිය එළි දක්වන ලදී.

## වර්තමාන තත්ත්වය

2006 වර්ෂයේ දී, වැසි ජල අස්වනු පද්ධතිය ස්ථාපිත කරන ලදී.

2007 වර්ෂයේ දී, අක්කර දෙකකින් සමන්විත ආදර්ශ ගොවිපළ ස්ථාපිත කරන ලදී. මෙය ගුණාත්මයෙන් ඉහළ එළවළු හා පළතුරු නිෂ්පාදනයත්, පර්යේෂණ ආයතනය වෙත දැනුම ලබා ගැනීමට පැමිණෙන්නන් හට ප්‍රායෝගික දැනුම ලබා දීමටත් උපකාරී වේ.

ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය සමග සම්බන්ධ වී පාංශු සංරක්ෂණ ක්‍රම පිළිබඳ ආදර්ශනයක් 2007 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

**ආචාර්ය එම්. නුගලියද්ද**
*ප්‍රධාන*
**කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය**
**සීතාඑළිය**
**නුවරඑළිය**

මෙම **'ගොවි ජනතා'** සඟරාව සකස් කිරීමේ දී, නුවරඑළිය සංඛ්‍යාන සහකාර **එච්.එම්.එස්. ජයරත්න** මහතාගෙන් ලද සහයෝගයට සංස්කාරක මණ්ඩලයේ විශේෂ ස්තුතිය හිමි වේ.

**- සංස්කාරක -**